


# අලියාන්ස්
# පවර්ලින්ක් රෙගියුලර්

ඔබේ ජීවිත රක්ෂණ, සෞඛ්‍ය රක්ෂණ
සහ ආයෝජන අවශ්‍යතා සියල්ලටම
දැන් එක් රක්ෂණ සැලසුමක්

අලියාන්ස් ලංකා (අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්) යනු, ජර්මනියේ මියුනික් හි ප්‍රධාන කාර්යාලය පැවැත්වෙන, රක්ෂණ හා වත්කම් කළමනාකරණය ආශ්‍රිතව ප්‍රමුඛතම මූල්‍ය සේවා සම්පාදකයකු වන අලියාන්ස් සමූහයෙහි පූර්ණ හිමිකාරිත්වය දරන උප සමාගම වේ.

147,000 ක කාර්ය මණ්ඩල ශක්තියෙන් සමන්විත අලියාන්ස්, ලොව පුරා රටවල් 70කට අධික සංඛ්‍යාවක තනි හා ආයතනික සේවාලාභීන් මිලියන 100කට පමණ සේවය සලසයි. 2020 වර්ෂයේ ලොව අංක 1 රක්ෂණ සන්නාමය ලෙස පිදුම්ලත් අලියාන්ස්, ජීවිත හා සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන ජාත්‍යන්තරයේ විශාලතම රක්ෂණ සමාගම් 5 අතුරින් එකකි.

## අලියාන්ස් පවර් ලින්ක් රෙගියුලර් (POWERLINK REGULAR)

අලියාන්ස් පවර්ලින්ක් යනු ක්‍රමානුකූලව වාරික ගෙවීම උදෙසා සකසන ලද විශේෂ ආයෝජන සහ රක්ෂණ සැලසුමකි. මෙහි ඇති විශේෂත්වය වන්නේ ඔබේ ජීවිතයට අවශ්‍ය රක්ෂණ ප්‍රතිලාභ සලසන අතරම ඔබේ ආයෝජනයට ඉහළම ප්‍රතිලාභ සැලසීමේ හැකියාවයි.

අවදානම් දැරීමට ඇති ඔබේ කැමැත්ත අනුව, ඔබට සුදුසුම ආයෝජන ක්‍රමවේදය තෝරාගැනීමේ නම්‍යතාවය අලියාන්ස් පවර්ලින්ක් රෙගියුලර් ලබා දෙයි.

## තෝරා ගත හැකි ආයෝජන අරමුදල් විකල්පයන්

ආයෝජනය සඳහා තෝරාගැනීමට අලියාන්ස් පවර්ලින්ක් ඔබට අරමුදල් 4 ක් ලබා දෙයි.

| | |
|---|---|
| අලියාන්ස් ග්‍රෝවිත් අරමුදල | මෙමගින් 95% ක උපරිමයක් දක්වා ශ්‍රී ලංකා කොටස් වෙළඳපොළ තුළ ආයෝජනය කෙරේ. මෙම අරමුදලේ ඉපැයීම් කිසිවක් සහතික නොකෙරෙන අතර එහි කාර්ය සාධනය ශ්‍රී ලංකා කොටස් වෙළඳපොළ ක්‍රියාකාරීත්වය මත රඳා පවතියි. මෙය අවදානම් දැරීමට කැමති අය සඳහා සැකසූ ආයෝජන ක්‍රමවේදයකි. |
| අලියාන්ස් බොන්ඩ් අරමුදල | මෙමගින් 80% ක උපරිමයක් දක්වා රජයේ බැඳුම්කර, ආයතනික බැඳුම්කර සහ ස්ථාවර තැම්පතු වැනි ශ්‍රී ලංකාවේ ස්ථිර ආදායම් මූල්‍ය මෙවලම් තුළ ආයෝජනය කරයි. මෙම අරමුදල කොටස් වෙළඳපල තුළ කිසිදු ආයෝජනයක් සිදු නොකරයි. මෙය සම්ප්‍රදායික ආයෝජන ක්‍රම තුළ පමණක් ආයෝජන සිදුකිරීමට කැමති අය සඳහා සැකසූ ආයෝජන ක්‍රමවේදයකි. මෙම අරමුදලේ ඉපැයීම් කිසිවක් සහතික නොකෙරෙන අතර එහි කාර්ය සාධනය එනම් ශ්‍රී ලාංකික ස්ථිර ආදායම් මූල්‍ය මෙවලම්හි ක්‍රියාකාරීත්වය මත රඳා පවතියි. |
| අලියාන්ස් බැලන්ස් අරමුදල | ශ්‍රී ලංකාවේ ස්ථිර ආදායම් මූල්‍ය මෙවලම් තුළ සහ ශ්‍රී ලංකා කොටස් වෙළඳපල තුළ යන දෙකෙහිම 60% ක උපරිමයක් දක්වා මෙමගින් ආයෝජනය කරයි. එබැවින් මෙම අරමුදල සමතුලිත ආයෝජන ක්‍රමවේදයක් ලෙස හැඳින්විය හැකියි. මෙම අරමුදලේ ඉපැයීම් කිසිවක් සහතික නොකෙරෙන අතර එහි කාර්ය සාධනය ශ්‍රී ලංකාවේ ස්ථිර ආදායම් මූල්‍ය මෙවලම් සහ ශ්‍රී ලංකා කොටස් වෙළඳපල යන බාණ්ඩ දෙකෙහිම ක්‍රියාකාරීත්වය මත රඳා පවතියි. |

| | |
|---|---|
| අලියාන්ස් ෂරියා අරමුදල | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) මගින් නියාමනය කරනු ලබන සහ අරමුදල් කළමනාකරණ ආයතනයක් විසින් කළමනාකරණය කරනු ලබන, ෂරියා අවශ්‍යතා සමග 100% ක් අනුකූලගතවූ මූල්‍ය වෙළඳපල අරමුදලක් වන හෙයින් අඩු අවදානමක් සහිත තිරසාර වර්ධනයක් බලාපොරොත්තු වන ආයෝජකයකු හට මෙය ඔබින අරමුදලකි. මෙම අරමුදලේ ඉපැයීම් කිසිවක් සහතික නොකෙරෙන අතර එහි කාර්ය සාධනය ශ්‍රී ලාංකික මූල්‍ය වෙළඳපලෙහි ක්‍රියාකාරීත්වය මත රඳා පවතියි. |

## සැලසුමෙන් හිමිවන ප්‍රතිලාභ

### ජීවිතය අහිමිවීමකදී

- රක්ෂණ කාල සීමාව තුළ - රක්ෂිත මුදල සහ ආයෝජන අරමුදල්හි ඒකක සියල්ලේ වටිනාකම

### රක්ෂණ කාල සීමාව තුළ

- අමතර ප්‍රතිලාභ

| | | |
|---|---|---|
| ඇතුලත් වීමේ වයස | අවම: වයස 18 | උපරිම: වයස 65 |
| කල් පිරීමේ වයස | - | උපරිම: වයස 75 |
| වාරික ගෙවීමේ මාදිලි | මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව සහ වාර්ෂිකව | |
| රක්ෂණ කාල සීමාව | අවම: වසර 10 | උපරිම: වසර 57 |
| වාරිකය | අවම: රු 5,000 | උපරිම: සීමාවක් නොමැත |
| අමතර වාරික | අවම: රු 20,000 | උපරිම: සීමාවක් නොමැත |
| ජීවිත ප්‍රතිලාභය | රක්ෂිතයා හට තමන්ට අවශ්‍ය රක්ෂණ ප්‍රතිලාභය තෝරා ගත හැක | |
| අතිරේක ප්‍රතිලාභ | - අතිරේක ජීවිතාවරණය<br>- හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන ජීවිත අහිමිවීම<br>- අසාධ්‍ය රෝග ආවරණය<br>- රෝහල් හිමිකම් දීමනාව<br>- පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවය<br>- පවුල් ආදායම් දීමනාව<br>- කලත්‍ර ජීවිතාවරණය<br>- ආන්තික රෝගාවරණය<br>- අර්ධ හා නිත්‍ය අකර්මණ්‍යතාවය (හදිසි අනතුරක් හේතුවෙන්)<br>- පවුලේ සාමාජිකයන් සඳහා වන සැත්කම් හා රෝහල් වියදම් දීමනා<br>- වාරික ආවරණය (අසාධ්‍ය රෝගී තත්වයක් හේතුවෙන් හෝ පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයකදී)<br>- ළමා ආවරණය<br>- අවමංගල වියදම් | |

## අනෙකුත් සුවිශේෂී ලක්ෂණ

### 1. කොටස් වශයෙන් මුදල් ආපසු ගැනීමේ හැකියාව

රක්ෂණ වසර 3 ක් අවසානයේ, එම වසර 3 සඳහා සම්පූර්ණ වාරික ගෙවා ඇත්නම් මෙම පහසුකම ඔබට හිමිවේ. රක්ෂණ හිමිකරුට කොන්දේසීන්ට යටත්ව තම ඒකක ගිණුමෙන් මුදල් කොටසක් ආපසු ලබා ගැනීමට හැකි වනු ඇත.

### 2. අරමුදල් ස්විච් (switch) කිරීමේ හැකියාව

ඔබේ ආයෝජනයට සලසා ඇති ආයෝජන අරමුදල් අතර ඔබේ මුදල් හුවමාරු කිරීමට මෙමගින් ඉඩ ප්‍රස්තාව සැලසේ. රක්ෂණ වසරක් තුළ දෙවතාවක් මෙසේ නොමිලේ ස්විච් කිරීමට ඔබට හැකි වනු ඇති අතර ඉන් පසු සෑම ස්විච් කිරීමකටම සුළු ගාස්තුවක් අය කෙරෙනු ඇත.

### 3. (Top-up) අමතර වාරික සමගින් අමතර ආයෝජන අවස්ථා

ඔබේ නිත්‍ය වාරිකයන්ට අමතරව, ඔබට හැකි විට ඔබේ ආයෝජන අරමුදල ඉහළ නැංවීමට අමතර වාරික ආයෝජනය කළ හැක.


**අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්**

සමාගම් අංක : PB 3493
25-27 වන මහල, වන් ගෝල්ෆේස් කුළුණ,
අංක 1ඒ, මැද පාර, ගාලු මුවදොර, කොළඹ 02.

දුරකථන : +94 112 300 400
විද්‍යුත් තැපෑල : customerservicelife@allianz.lk
වෙබ් අඩවිය : www.allianz.lk


**සැලකිය යුතුයි**

මෙම අලෙවි මෙවලමේ සඳහන් තොරතුරු, රක්ෂණ සැලසුමේ සංක්ෂිප්තයක් පමණි. සම්පූර්ණ කොන්දේසි සහ විස්තර සඳහා අලියාන්ස් පවර් ලින්ක් රෙගියුලර් රක්ෂණ ඔප්පුව බලන්න.